# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/34 - 2022 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා - 2022.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.-බී 4/2017

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වන, 10 වන, 11 වන, 13 වන, 14 වන, 16 වන සහ 31 වන වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 117 වන වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය

2022 අගෝස්තු මස 03 වැනි දින, කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2022 අංක 1 දරන ශ්‍රී ලංකා ජලාශ්‍රිත ගගන යාත්‍රාංගන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (අ) පනතේ 6 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද යටතේ නිශ්චිතව දක්වා ඇති ගගන නාවික සේවා සැපයීම සඳහා පත්කර ඇති සේවා සැපයුම්කරුවකු ;


1A - PG 5920 — 506 (2022/08)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) ඉපිලියානා මෙහෙයුම් සඳහා ගුවන් යානා මෙහෙයුම්කරු සහතිකයක් දරන ගුවන් යානා හිමිකරුවකු හෝ මෙහෙයුම්කරුවකු ;

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හෝ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ ලියාපදිංචි වී ඇති චාරිකා, හෝටල් හෝ සංචාරක මෙහෙයුම්කරුවකු ; හෝ

(ඈ) යම් ජලාශයක හිමිකරුවකු හෝ නීත්‍යානුකූල මෙහෙයුම්කරුවකු,
ජලාශ්‍රිත ගගන යාත්‍රාංගන බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් ලබන්නේය.

3. (1) (මෙහි මින්මතු "ගගන යාත්‍රාංගනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජලාශ්‍රිත ගගන යාත්‍රාංගනයක් පිහිටුවීමට, මෙහෙයවීමට හෝ පවත්වාගෙන යාමට අපේක්ෂා කරනු ලබන යම් අයදුම්කරුවකු විසින්-

(අ) නියම කරනු ලැබිය හැකි පරිදි වන බලපත්‍ර ගාස්තුවක් ;
(ආ) ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතෙහි පිටපතක් ;
(ඇ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(ආආ) වගන්තිය යටතේ ගගන යාත්‍රාංගනය පිළිබඳ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක්;
(ඈ) ගගන යාත්‍රාංගනය පිහිටුවීම සඳහා අදාළ පළාත් පාලන ආයතන, ජලාශ භාර ආයතන හෝ දෙපාර්තමේන්තු සහ ජලාශයන්හි නීත්‍යානුකූල හිමිකරු හෝ මෙහෙයුම්කරු වෙතින් ලබා ගත් අනුමතය;
(ඉ) යෝජිත ගගන යාත්‍රාංගනය ඉදි කිරීම සම්බන්ධ විස්තරාත්මක සැලැස්මක්;
(ඊ) ගගන යාත්‍රාංගනයක් සැලසුම් කරනු ලැබූයේ යම් ගුවන් යානයක් සඳහා ද එම ගුවන් යානයේ ලක්ෂණ සමඟ අනුකූල වන ගගන යාත්‍රාංගන දත්ත;
(උ) ගගන යාත්‍රාංගනයේ මධ්‍ය ලක්ෂ්‍යයේ සිට නාවික සැතපුම් දහයක භූමි ප්‍රදේශයක් වටවන යෝජිත ගගන යාත්‍රාංගන භූමියේ භූ ලක්ෂණ සිතියමක්; සහ
(ඌ) අවතීර්ණ පෘෂ්ඨයේ පවතින යම් සුවිශේෂී බාධක පිළිබඳ විස්තර,

සමග මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති 'අ' ආකෘතියෙන් වන ගගන යාත්‍රාංගන බලපත්‍රයක් සඳහා වන අයදුම් පත්‍රයක් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ගගන යාත්‍රාංගන බලපත්‍රයක් නිකුත් කිරීමට පෙරාතුව-

(අ) හමුදා ගගන යාත්‍රාංගන ඇතුළුව වෙනත් ගගන යාත්‍රාංගන වෙත ස්ථානයේ ඇති ආසන්නතාවය;
(ආ) බාධක සහ පවතින ගුවන් අවකාශ සීමාවන්;
(ඇ) ගගන යාත්‍රාංගනය ඉදිකිරීම මහජන යහපතට එරෙහි නොවන බව;
(ඈ) යාබද ඉඩම්වල තත්වය;
(ඉ) 3 වන නියෝගය යටතේ අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛනවල නිරවද්‍යතාවය; සහ
(ඊ) ගගන යාත්‍රාංගන පහසුකම්, සේවා සහ උපකරණ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණ සහ ස්ථානීය පරීක්ෂණවල සොයාගැනීම්,

සැළකිල්ලට ගනිමින්, ගගන යාත්‍රාංගනය ඉදි කිරීම සඳහා යෝජිත ස්ථානයේ යෝග්‍යතාවය තක්සේරු කරනු ලැබිය යුතු ය.

5. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් -

(අ) 3 වන සහ 4 වන නියෝගවල සඳහන් අවශ්‍යතාවයන්වලට අනුකූලව කටයුතු කරන ඉල්ලුම්කරුවකු වෙත මෙහි I වන උපලේඛනයේ දක්වා ඇති 'ආ' ආකෘතියෙහි වන ගගන යාත්‍රාංගන බලපත්‍රයක් II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව නිකුත් කරනු ලැබිය යුතු ය; නැතහොත්

(ආ) ඉල්ලුම්කරුවකු වෙත ගගන යාත්‍රාංගන බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කළ හැකි අතර එම තීරණය සිදු කිරීමෙන් දින දාහතරක් ගතවීමට පෙර එම ප්‍රතික්ෂේප කිරීම හේතු සහිතව ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

6. ගගන යාත්‍රාංගන බලපත්‍රයක් -

(අ) පනතේ 26 වන වගන්තිය යටතේ අත්හිටුවනු ලැබ හෝ අවලංගු කරනු ලැබ ඇත්නම් මිස අත්හිටුවනු ලබන හෝ අවලංගු කරනු ලබන තෙක් වලංගු වන අතර නැවත අලුත් කරනු ලැබිය හැකි ය;

(ආ) පැවරිය නොහැක.

7. (1) (මෙහි මින්මතු "මෙහෙයුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ගගන යාත්‍රාංගනයක මෙහෙයුම්කරුවකු වීමට අපේක්ෂා කරන යම් ඉල්ලුම්කරුවකු විසින්, ගගන යාත්‍රාංගන බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම්පත්‍රය සමග, ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොත පිටපත් දෙකකින් යුතුව අනුමතය සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොත -

(අ) මෙහෙයුම්කරු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය;

(ආ) මුද්‍රිත ආකෘතියෙන් තිබිය යුතු අතර පිටපත් සම්බන්ධයෙන් වන විට මුද්‍රිත හෝ විද්‍යුත් ආකෘතියකින් තිබිය යුතු ය;

(ඇ) ප්‍රතිශෝධනය කිරීමට පහසු ආකෘතියකින් තිබිය යුතු ය;

(ඈ) ගගන යාත්‍රාංගනයේ මෙහෙයුම් සහ නඩත්තු කටයුතුවලට සහ ඊට අදාළ සේවාවන්ට

සම්බන්ධ සේවා නියුක්තයන්, පහසුකම්, උපකරණ, සේවා සහ කාර්ය පටිපාටි පිළිබඳ තොරතුරු සහ අධ්‍යක්ෂ- ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් තොරතුරු ඇතුළත් කළ යුතු ය;

(ඉ) ප්‍රතිශෝධන සටහන් සඳහා වන පිටුවක් ඇතුළුව, පවතින පිටු සහ යම් සංශෝධන සටහන් කිරීම සහ යාවත්කාලීන කිරීම සඳහා ක්‍රමවේදයක් සහිත විය යුතු ය;

(ඊ) සකස් කිරීම, සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම පහසු කරන්නා වූ ආකාරයකට සකසනු ලැබිය යුතු ය.

(3) මෙහෙයුම්කරුවකු විසින් -

(අ) අනුමත කරන ලද ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතෙහි පිටපතක් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය ලබා දී ඇති යම් නිලධරයකු වෙත යැවිය යුතු අතර, ගගන යාත්‍රාංගනය ක්‍රියාත්මකව පවතින කවර හෝ විටක දී බලයලත් තැනැත්තන්ගේ පරීක්ෂා කිරීම සඳහා අනුමත කරන ලද අනෙක් පිටපත මෙහෙයුම්කරුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයෙහි තැබිය යුතු ය;

(ආ) ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතෙහි සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව පවත්වාගෙන යාම සඳහා එසේ කිරීම අවශ්‍ය වන අවස්ථාවන්හි දී, එම ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොත සංශෝධනය කරනු ලැබිය යුතු ය. ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතට සිදු කරනු ලබන යම් සංශෝධනයක් අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ ලිඛිත විධානවලට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිළිගත හැකි කාර්යපටිපාටියකට අනුව සිදු කරනු ලැබිය යුතු ය;

(ඇ) ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති කාර්යපටිපාටිවලට අනුකූලව ගගන යාත්‍රාංගනය මෙහෙයවීම සහ පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය යුතු ය;

(ඈ) ගගන යාත්‍රාංගනයේ භෞතික තත්ත්වයෙහි යම් තාවකාලික හෝ ස්ථිර වෙනසක් සහ ගුවන් යානා නිරුපද්‍රිතව මෙහෙයවීම කෙරෙහි බලපෑ හැකි ගගන යාත්‍රාංගනයේ මෙහෙයවීමට හෝ නඩත්තු කිරීමට අදාළ වෙනත් යම් සිදුවීමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය;

(ඉ) ගුවන් සංතරණයේ නිරුපද්‍රිතතාව සඳහා යම් වෙනස්කම් අවශ්‍ය වන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සලකනු ලබන විට දී, ඔහුගේ විධානයන් මත ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති කාර්යපටිපාටිය වෙනස් කරනු ලැබිය යුතු ය.

8. (1) මෙහෙයුම්කරුවකු විසින්, ගගන යාත්‍රාංගන බලපත්‍රය නිකුත් කිරීමෙන් ඉක්බිතිව ම -

(අ) ගගන යාත්‍රාංගනයක සිදු කරනු ලබන ගුවන් යානා මෙහෙයුම් සහ කටයුතුවලට අනුකූල විය යුතු;

(ආ) ගගන යාත්‍රාංගනයක හෝ ඒ ආසන්නයේ යම් හදිසි අවස්ථාවක් ඇති වන විට දී ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කිරීම සඳහා කටයුතු සැලසිය යුතු;

(ඇ) සුදුසු ගලවා ගැනීමේ විශේෂඥ සේවා සූදානම්ව පැවතීම සහ එම සේවා සම්බන්ධීකරණය කිරීම- ඇතුළත් විය යුතු,

ගගන යාත්‍රාංගන හදිසි අවස්ථා සැලැස්මක් ගගන යාත්‍රාංගනයෙහි ස්ථාපිත කළ යුතු ය.

(2) (1) වන අනු නියෝගයේ සඳහන් කර ඇති හදිසි අවස්ථාවක් යන්නට -

(අ) ගුවන් යානාවක හදිසි අවස්ථාවක්;

(ආ) ස්වභාවික ආපදා සහ බෝම්බ තර්ජන ඇතුළු විනාශකාරී ක්‍රියාවක්;

(ඇ) ගුවන් යානාවක් නීති විරෝධී ලෙස ග්‍රහණයට ගැනීමක්;

(ඈ) ගුවන් යානාවක් අනිසි ලෙස හැසිරවීමෙන් ඇති වන බලපෑමක්;

(ඉ) අන්තරායකාරී භාණ්ඩ ප්‍රවාහනය කිරීමක් සහ ගබඩා කිරීමක්; සහ

(ඊ) ගොඩනැගිලි තුළ ගිනි හට ගැනීමක්,

ඇතුළත් වේ.

(3) යම් ගගන යාත්‍රාංගනයක පිටත සිදු විය හැකි හදිසි අවස්ථාවක් ඇතුළුව යම් හදිසි අවස්ථාවක් ඇති වූ විට දී, ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථාන සමඟ සම්බන්ධීකරණය වීම සඳහා සහ පහත සඳහන් නියෝජ්‍යායතනයන්ගේ සහාය අවශ්‍ය වේද එම නියෝජ්‍යායතනයන්ගේ සහභාගීත්වය ලබා ගැනීම සඳහා හදිසි අවස්ථා සැලැස්මක් සූදානම් කර තැබිය යුතු ය:-

(අ) ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව;

(ආ) පොලීසිය;

(ඇ) සන්නද්ධ හමුදා;

(ඈ) වෛද්‍ය සහ ගිලන් රථ සේවා; සහ

(ඉ) රෝහල්.

9. යම් මෙහෙයුම්කරුවකු විසින් ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතට අනුකූලව නිරුපද්‍රිතතා කළමනාකරණ පද්ධතියක් පිහිටුවනු ලැබිය යුතු ය.

10. මෙහෙයුම්කරුවකු විසින් -

(අ) ගගන යාත්‍රාංගන නිසි බලධරයා විසින් සුපරීක්ෂණ වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බව සහතික කිරීම සඳහා වන ක්‍රියා පටිපාටිය සහ

(ආ) යම් පරීක්ෂණයක් අතරතුර නිරීක්ෂණය කරන ලද අනාරක්ෂිත ගගන යාත්‍රාංගනයක තත්ත්වය වහාම නිවැරදි කිරීම සහතික කිරීම සඳහා වාර්තා කිරීමේ පද්ධතියක්,

සම්බන්ධයෙන් විධිවිධාන සලස්වනු ලබන ඵලදායී සුපරීක්ෂණ වැඩසටහනක් සකස් කොට පවත්වාගෙන යා යුතු ය.

11. (1) මෙහෙයුම්කරුවකු විසින් ගගන යාත්‍රාංගනයක ඇතිවිය හැකි යම් ගින්නකට එරෙහිව, එම ගින්න වළක්වා ගැනීමේ පියවර ඇතුළත් ගිනි ගැනීම් වළක්වා ගැනීමේ සහ මුදා ගැනීමේ වැඩසටහනක් ඇතිකර එය පවත්වාගෙන යාම සහ නඩත්තු කිරීම කළ යුතු අතර එම ගිනි ගැනීම් වළක්වා ගැනීමේ වැඩසටහන ක්‍රියාවෙහි නැංවීම සඳහා යම් තැනැත්තකු හඳුන්වා දිය යුතු ය.

(2) ගගන යාත්‍රාංගනයක් සතුව නම් කරන ලද ගිනි නිවීමේ සේවාවක් නොමැති විට දී, මෙහෙයුම්කරු විසින්, ගගන යාත්‍රාංගනය සඳහා ගිනි නිවීමේ සහ වැළැක්වීමේ වැඩසටහනක් පවත්වාගෙන යාමට සහ නිවැරදි කළ යුතු යම් අනතුරුදායක තත්ත්වයක් සම්බන්ධයෙන් මෙහෙයුම්කරුට උපදෙස් ලබා දීමට එම ප්‍රදේශයේ අදාළ පළාත් පාලන ආයතනයේ ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව හෝ වෙනත් යම් ගිනි නිවීමේ අධිකාරියක් සමඟ කටයුතු සංවිධානය කරනු ලැබිය යුතු ය.

12. සෑම බලපත්‍රලාභී ගගන යාත්‍රාංගනයකම -

(අ) ගගන යාත්‍රාංගනය බලපත්‍රලාභී බව දැක්වීමට;

(ආ) ගගන යාත්‍රාංගන ප්‍රමිතිවල නිශ්චිතව දක්වා ඇති තොරතුරු ඇතුළත් වන්නා වූ;

(ඇ) ජලාශය වටා එක් ස්ථානයකට වඩා වැඩි ස්ථානයන්හි දී පැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු,

හඳුනාගැනීමේ සංඥා තිබිය යුතු ය.

13. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ගගන යාත්‍රාංගන බලපත්‍රයක් නිකුත් කිරීමට පෙරාතුව සහ එයින් පසු ඕනෑම අවස්ථාවක ගගන යාත්‍රාංගනයේ නිරුපද්‍රිතතාව පවත්වාගෙන යන බවට සහතික කර ගැනීමේ කාර්යය සඳහා -

(අ) ගගන යාත්‍රාංගන පහසුකම්, සේවා සහ උපකරණ පිළිබඳ පරීක්ෂා කිරීම සහ පරීක්ෂණ කරගෙන යෑම සිදු කරනු ලැබිය යුතු ය;

(ආ) ගගන යාත්‍රාංගනයේ නිරුපද්‍රිතතා කළමනාකරණ පද්ධතිය පරීක්ෂා කර තහවුරු කරනු ලැබිය යුතු ය;

(ඇ) II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි බලපත්‍රලාභී ගගන යාත්‍රාංගනයේ භෞතික තත්ත්වය සහ ක්‍රියාකාරීත්වයේ තත්ත්වය සම්බන්ධයෙන් අදාළ තොරතුරු සහිත රෙජිස්ටරය යාවත්කාලීන කිරීම කළ යුතු ය.

14. (අ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් මේ නියෝගවලට අනුකූලව නිරුපද්‍රිතතා පරීක්ෂාවක් හෝ විගණනයක් කරගෙන යාම මෙහෙයුම්කරු විසින් වළක්වනු ලබන අවස්ථාවක දී;

(ආ) නිරුපද්‍රිතතා පරීක්ෂාවේ දී හෝ විගණනයේ දී, ගගන යාත්‍රාංගනයේ මෙහෙයුම්කරු මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කර නොමැති බව සහ එම පරීක්ෂාවෙන් පසුව අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද නිලධරයා විසින් නියම කරන ලද කාලසීමාවක් ඇතුළත මෙහෙයුම්කරු විසින් යම් අනනුකූලතාවක් නිවැරදි කිරීම පැහැර හැර ඇති බවට සොයා ගනු ලබන අවස්ථාවක දී;

(ඇ) ගුවන් සේවාවන්හි නිරුපද්‍රිතතාව සැලකිල්ලට ගෙන එසේ සිදු කිරීම අවශ්‍ය බවට අධ්‍යක්ෂ - ජනරාල්-වරයා විසින් සලකනු ලබන අවස්ථාවක දී; හෝ

(ඈ) බලපත්‍රයේ මූලික කොන්දේසි පවත්වාගෙන නොයන හෝ ජලාශය අවට භූමි පරිහරණයේ වෙනස්වීම හේතුවෙන් එසේ පවත්වාගෙන යා නොහැකි වන අවස්ථාවක දී,

අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ගගන යාත්‍රාංගන බලපත්‍රයක් අත්හිටුවනු ලැබිය යුතු ය.

15. ගගන යාත්‍රාංගන බලපත්‍රයක් අත්හිටුවීම මගින් අතෘප්තියට පත් යම් මෙහෙයුම්කරුවකු විසින් පනතේ විධිවිධාන යටතේ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලිඛිතව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

16. (1) (අ) මෙහෙයුම්කරු විසින් ගගන යාත්‍රාංගනයේ මෙහෙයුම් අත්හැර දමා තිබෙන අවස්ථාවක දී;

(ආ) ගගන යාත්‍රාංගන බලපත්‍රය නිකුත් කරන ලද්දේ කවර කොන්දේසිවලට යටත්ව ද මෙහෙයුම්කරු විසින් එම යම් කොන්දේසියක් කඩ කරනු ලබන අවස්ථාවක දී,

අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ගගන යාත්‍රාංගන බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් යම් ගගන යාත්‍රාංගන බලපත්‍රයක් අවලංගු කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් ඒ පිළිබඳ දැන්වීමක් අවම වශයෙන් එකම දිනයක වන දේශීය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වල පළ කරනු ලැබීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

17. (1) යම් ගගන යාත්‍රාංගනයක මෙහෙයුම්කරුවකු බලපත්‍රය ආපසු භාර දීමට අපේක්ෂා කරන්නේ නම්, ඔහු විසින් ඔහුගේ ඒ පිළිබඳ දැන්වීම එසේ ආපසු භාර දීමට අදහස් කරන දිනයට දින අනූවකට නොඅඩු කාලයකට පෙර අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ලිඛිතව ලබා දිය යුතු ය.

(2) මෙහෙයුම්කරු විසින් නිශ්චිතව දක්වනු ලබන දිනයේ දී ගගන යාත්‍රාංගන බලපත්‍රය අවලංගු කිරීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පියවර ගනු ලැබිය යුතු ය.

18. 16 වන නියෝගය යටතේ ගගන යාත්‍රාංගන බලපත්‍රයක් අවලංගු කරනු ලැබූයේ යම් මෙහෙයුම්ක-රුවකුගේ ද ඔහු විසින් එම අවලංගු කිරීම සිදු කරන ලද දිනයේ දී -

(අ) එම ගගන යාත්‍රාංගන බලපත්‍රය අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ආපසු ලබා දිය යුතු ය;

(ආ) ගගන යාත්‍රාංගන භූමියෙහි ඇති සියලුම ගගන යාත්‍රාංගන හඳුනාගැනීමේ සංඥා ඉවත් කරනු ලැබිය යුතු ය.

19. පහත දැක්වෙන ක්‍රියාවන් ගගන යාත්‍රාංගනයක් තුළ සිදු කිරීම තහනම් වේ:-

(අ) ගගන යාත්‍රාංගන බලපත්‍රයෙහි හෝ ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතෙහි නිශ්චිතව දක්වන ලද යම් කොන්දේසියක් උල්ලංඝනය කරමින් ගගන යාත්‍රාංගනය මෙහෙයවීම;

(ආ) ගගන යාත්‍රාංගනය නිසියාකාරව භාවිත කිරීමේ දී එයට බාධා කිරීම හෝ අවහිර කිරීම;

(ඇ) ගගන යාත්‍රාංගනයට අදාළව තම රාජකාරි ඉටු කිරීමෙහි යෙදී සිටින යම් තැනැත්තකුට බාධා කිරීම;

(ඈ) යම් ගුවන්යානයක් භාරව සිටින තැනැත්තකුගේ අවසරයකින් තොරව එම ගුවන් යානයට ඇතුළුවීම හෝ ඇතුල්වීමට තැත් කිරීම;

(ඉ) ගුවන්යානයක් හෝ ගුවන්යානයක් හා සම්බන්ධව භාවිත කරනු ලබන යම් කිසිවක් එම ගුවන්යානය හෝ ගුවන් යානය හා සම්බන්ධව භාවිත කරනු ලබන යම් කිසිවක් භාරව සිටින තැනැත්තකුගේ අධිකාරයකින් තොරව අයුතු ලෙස වෙනස්කම් කිරීම;

(ඊ) එහි යම් ස්ථානයක් තුළ පහත සඳහන් අවස්ථාවකදී, දුම්බීම හෝ අන්‍යාකාරයකින් එම ස්ථානයට ගින්දර ගෙන ඒම හෝ ඒ තුළ ගිනි දැල්වීමඃ-

(i) එය තහනම් ක්‍රියාවක් ලෙස දැක්වෙන දැන්වීමක් ඒ ස්ථානයේ හෝ ඒ අසල ප්‍රදර්ශනය කර ඇති විට; හෝ

(ii) ගුවන්යානයක් හෝ ද්‍රව ඉන්ධන හෝ පුපුරණ ද්‍රව්‍ය ගබඩාවක් එහි සිට මීටර් පහළොවක් ඇතුළත පිහිටා ඇති විට;

(උ) හදිසි ගින්නක් ඇති කරවන හෝ එවැන්නකට හේතු වන යම් ක්‍රියාවක් සිදු කිරීම;

(ඌ) ගුවන්යානයක්, අදාළ කාර්ය භාරව සිටින තැනැත්තා විසින් නියම කරනු ලබන යම් ස්ථානයක හෝ පිහිටීමක තැබීම පැහැර හැරීම;

(එ) නිශ්චල ගුවන්යානයක් නිසි පරිදි නවත්වා තැබීමට හෝ අන්‍යාකාරයකින් නිසි පරිදි සුරක්ෂිතව තැබීමට අපොහොසත් වීම;

(ඒ) චංචල හෝ නිශ්චල වුවද ගගන යාත්‍රාංගනයේ කොටසක් වන හෝ ඒ සඳහා සපයන ලද හෝ ඒ හා සම්බන්ධ, යම් ව්‍යුහයක් හෝ වෙනත් දේපළක් (යම් දැන්වීමක් ද ඇතුළුව) භාරව සිටින තැනැත්තාගේ අවසරය නොමැතිව එවැන්නක් අස්ථානගත කිරීම, හානි කිරීම, විකෘති කිරීම හෝ වෙනස් කිරීම;

(ඔ) යම් ගුවන්යානයක හෝ එහි මගීන්ගේ, බඩු තොගයේ භාණ්ඩවල හෝ සේවක පිරිසගේ නිරුපද්‍රිතතාව හෝ සුරක්ෂිතතාව අනතුරට පත් වීමට හෝ ගගන යාත්‍රාංගනයේ නිසි ක්‍රියාකාරීත්වයට බාධා පැමිණවීමට ඉඩ ඇති තත්ත්වයන්හි දී මේ නියෝග අදාළ වන්නා වූ ගගන යාත්‍රාංගනයකට ඇතුල් වීම හෝ එතුළ රැඳී සිටීම;

(ඕ) මෙහෙයුම් කාර්ය මණ්ඩලයට බාධාකාරී වන යම් උපකරණයක් හෝ ලේසර් කිරණ භාවිත කිරීම හෝ සරුංගල් යැවීම.

20. (1) මෙහෙයුම්කරු විසින් -

(අ) ගගන යාත්‍රාංගනයේ හෝ ඒ අවට ප්‍රදේශය තුළ ඇති බාධක හඳුනාගත් බවට සහ ඒ පිළිබඳව අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත වාර්තා කළ බවට සහතික කිරීම සඳහා සියලු සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය.

(ආ) මෙහෙයුම් වේලාවන් තුළ ධාවන ප්‍රදේශය උපද්‍රවවලින් තොර වන බවට වග බලා ගත යුතු ය;

(ඇ) මේ නියෝග උල්ලංඝනය කරමින් ගගන යාත්‍රාංගනය තුළ නැංගුරම් ලා ඇති, බැඳ තබා ඇති හෝ අන්‍යාකාරයෙන් ඒ තුළ ඇති, යම් වස්තුවක් හෝ යාත්‍රාවක් ඉවත් කිරීම සඳහා සියලු සාධාරණ පියවර ගත යුතු ය;

(ඈ) මෙහෙයුම් වේලාවන් අතරතුර සියලුම ගුවන් යානා හා ඒවායෙහි මගීන්, බඩු හා කාර්ය මණ්ඩලයේ නිරුපද්‍රිතතාව ප්‍රවර්ධනය කිරීම සඳහා මේ නියෝග අදාළ වන්නා වූ ගගන යාත්‍රාංගනයකට අවසර නොලත් තැනැත්තකු ඇතුල් නොවන බව හෝ එහි රැඳී නොසිටින බව සහතික වීමට වගබලා ගත යුතු ය;

(ඉ) ගුවන් යානය හා භූමිය අතර සිදු වන සන්නිවේදනයට බාධා වීමට හේතුවිය හැකි යම් උපාංගයක් මේ නියෝග අදාළ වන්නා වූ යම් ගගන යාත්‍රාංගනයක දී, කිසිදු තැනැත්තකු විසින් මෙහෙයවනු නොලබන බවට සහතික විය යුතු ය;

(ඊ) ගුවන් යානයක නිරුපද්‍රිත මෙහෙයුම කෙරෙහි බලපෑ හැකි යම් ගගන යාත්‍රාංගනයක් පිළිබඳ (ගුවන් නියමුවන් හට දැන්වීමක් නිකුත් කිරීම සඳහා) හැකි ඉක්මණින් ගගන නාවික තොරතුරු සේවාව (AIS) වෙත දැනුම් දිය යුතු ය;

(උ) ගගන යාත්‍රාංගනයේ අනාරක්ෂිත තත්ත්වයන් පවතින අවස්ථාවන් හි දී ගගන යාත්‍රාංගනයේ කොටස්වල ගුවන් යානා මෙහෙයුම් සිදු නොකරන බවට සහතික විය යුතු ය.

(2) (අ) මෙහෙයුම්කරු විසින් ගගන යාත්‍රාංගනයක් සඳහා අවම වශයෙන් එක් සුළං දිශා දර්ශකයක්වත් සපයා පවත්වා ගෙන යා යුතු ය.

(ආ) සුළං දිශා දර්ශකයක්, අසල ඇති වස්තූන්ගෙන් හටගන්නා වායු කැළඹීමෙන් සිදු වන බලපෑම්වලින් තොර විය හැකි ආකාරයට සහ පියාසර කරන යානයකට හෝ ගගන යාත්‍රාංගනයේ ධාවන ප්‍රදේශයට පෙනෙන ආකාරයට ස්ථානගත කළ යුතු ය.

(ඇ) සුළං දිශා දර්ශකයක ලක්ෂණ හා එය ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම සඳහා වන ක්‍රමවේදයන් හා කාර්ය පටිපාටීන්, ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ක්‍රමවේදයන් හා කාර්ය පටිපාටීන්ට අනුකූල විය යුතු ය.

21. (1) ඉපිලියානා මෙහෙයවීම සඳහා අනුමතය දරන ඕනෑම ගුවන් යානයකට අදාළ ගාස්තු ගෙවීමට යටත්ව මෙහෙයුම් වේලාවන්හි දී ගගන යාත්‍රාංගනයක් භාවිත කිරීමේ අවස්ථාව තිබිය යුතු ය.

(2) ගගන යාත්‍රාංගනයක්, ගුවන් යානා මෙහෙයුම් කටයුතු සඳහා උදය කාලයේ සිට සවස් කාලය දක්වා විවෘතව තැබිය යුතු ය.

(3) ගගන යාත්‍රාංගනයක් පිහිටුවා මෙහෙයවනු ලබන්නේ යම් ජලාශයක ද එම ජලාශයේ හිමිකරු විසින්, සෑම ගුවන් යානා මෙහෙයුම්කරුවකුගෙන්ම ජලාශය භාවිත කිරීම වෙනුවෙන් එක් එක් ගොඩ බැස්සවීමක් සඳහා, නියම කරනු ලැබිය හැකි ගාස්තුවක් අය කරනු ලැබිය හැකි ය.

22. (1) අවතීර්ණ පෘෂ්ඨයේ සිට මීටර් තුන්දහසක් (3000m) ඇතුළත යෝජිත යම් ඉදිකිරීම් කටයුත්තක් පිළිබඳව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ලිඛිතව මෙහෙයුම්කරුට දැනුම් දිය යුතු ය. එවැනි අවස්ථාවක, ගගන යාත්‍රාංගන සඳහා බාධක නියාමනය කිරීම අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කළ නොහැකි අතර අමාත්‍යවරයා විසින් වෙනත් යම් ආකාරයකට තීරණය කර නොමැති නම් ඉදිකිරීම් කටයුත්ත සඳහා ප්‍රමුඛතාවය දිය යුතු ය.

(2) (1) වන අනුනියෝගය යටතේ දැනුම්දීමක් ලද පසු මෙහෙයුම්කරු විසින්-

(අ) ඉදිරියෙහි ඇති විය හැකි බාධකය, අවතීරණ පෘෂ්ඨයට ඇතුල් වන්නේ නම්, මෙහෙයුම් සම්බන්ධයෙන් වන යම් විකල්පයක් පිළිබඳව අධ්‍යක්ෂ- ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය; නැතහොත්

(ආ) එකී දැනුම්දීමෙන් මාස හයක කාලසීමාවක් ඇතුළත නව ගගන යාත්‍රාංගනයක් පිහිටුවීමට විකල්ප ස්ථානයක් සොයා ගත යුතු ය.

(3) මෙහෙයුම්කරු වෙනත් ස්ථානයක ගගන යාත්‍රාංගනයක් පිහිටුවීමට අදහස් කරන අවස්ථාවක, ගගන යාත්‍රාංගන බලපත්‍රයක් සඳහා වන අයදුම්පත්‍රයක් 3 වන නියෝගය යටතේ ඉදිරිපත් කළ යුතු අතර, එම බලපත්‍රය නිකුත් කිරීමට අදාළව 4 වන සහ 5 වන නියෝගවල සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ නියෝගවල -

"පනත" යන්නෙන්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත අදහස් වේ;

"අවතීර්ණ පෘෂ්ඨය" යන්නෙන් -

(අ) ධාවන පථයේ කෙළවර සිට ධාවන පථයේ දීර්ඝ කරන ලද මධ්‍ය රේඛාවට ලම්භකව, තිරස්ව සහ සමමිතිකව නිශ්චිත දුරකින් පිහිටි නිශ්චිත පළලක් සහිත ඇතුළු කෙළවරකින් ද;

(ආ) ඇතුළු කෙළවරෙන් ආරම්භ වී එහි දීර්ඝ කරන ලද මධ්‍ය රේඛාව අසළින් ඒකාකාරව නිශ්චිත අනුපාතයකට අපසරණය වෙමින් තිරස් දුරකට විහිදෙන පැති දෙකක් සහිතව ද;

(ඇ) ඇතුල් කෙළවරට සමාන්තර වූ පිටත කෙළවරකින් යුක්ත වන්නා වූ ද; සහ

(ඈ) පාර්ශ්වීය අනුලම්බීය, අනුලම්බීය හෝ වක්‍ර අවතීර්ණයන් භාවිතයේ දී එම පාර්ශවීය අනුලම්බීය, අනුලම්බීය හෝ වක්‍ර භූමි පථයේ ඇතුළු කෙළවර දෙපස අන්තයෙන් ආරම්භ වී දීර්ඝ කරන ලද මධ්‍ය රේඛාවේ සිට නිශ්චිත අනුපාතයකට ඒකාකාරව අපසරණය වන ලෙස උක්ත පෘෂ්ඨය වෙනස් වීම අනිවාර්ය වන්නා වූ ද,

ඉදිරියෙන් ආනතව පිහිටි පර්යන්තයක් අදහස් වේ;

"අධිකාරිය" යන්නෙන්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත මගින් පිහිටුවන ලද සිවිල් ගුවන් සේවා අධිකාරිය අදහස් වේ;

"අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන්නෙන්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 11 වන වගන්තිය මගින් පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ;

"ඉපිලියානය" යන්නෙන්, ජල පෘෂ්ඨයට ඉහළින් ගුවන් යානයේ ව්‍යුහය දරා සිටීමට වෙන් වෙන් වශයෙන් වූ ඉපිලිවලින් සැදුම්ලත් ජල ගගන යාත්‍රාවක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ සිවිල් ගුවන් සේවා විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වන අතර අමාත්‍යාංශය යන යෙදුම ඒ අනුව කියවා තේරුම් ගත යුතු ය;

"ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරු" යන්නට, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"නිරුපද්‍රිතතා කළමනාකරණ පද්ධතිය" යන්නෙන්, ගගන යාත්‍රාංගනයක නිරුපද්‍රිතතාව සහ එහි ආරක්ෂාකාරී භාවිතය පාලනය කිරීම සඳහා වූ සංවිධානාත්මක ව්‍යුහය, වගකීම් සහ වගවීම්, කාර්ය පටිපාටීන්, ක්‍රියාවලීන් සහ මෙහෙයුම් කරුවකු විසින් ගගන යාත්‍රාංගනයක නිරුපද්‍රිතතා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ විධිවිධාන ඇතුළත් ගගන යාත්‍රාංගනයක ආරක්ෂාව පාලනය කිරීම සඳහා වූ පද්ධතියක් අදහස් වේ;

"ජලාශ්‍රිත ගගන යාත්‍රාංගනය" යන්නෙන්, භූමිය මත හෝ ජලය මත ඇති ගොඩනැගිලි හා උපකරණ ඇතුළුව ගුවන් යානා ගොඩ බැස්සවීම, ගුවන්ගත වීම හා ධාවනය සඳහා සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ භාවිත කිරීමට අදහස් කර ඇති ජලාශයක මායිම් සීමා නියම කරන ලද ප්‍රදේශයක් අදහස් වේ;

"ජලාශය" යන්නෙන්, සැලකිය යුතු ප්‍රමාණයේ ජලාශයක් අදහස් වන අතර, ඊට සම්පූර්ණ ගංගාවක්, ඇල මාර්ගයක්, වැවක්, ජල සංචිතයක්, මුහුදක්, කලපුවක්, මුහුදු බොක්කක් හෝ වරායක් ඇතුළත් විය හැකි ය.

**I** වන උපලේඛනය **[3** වන නියෝගය**]**

අ ආකෘතිය

ජලාශ්‍රිත ගගන යාත්‍රාංගන බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රය

1. ඉල්ලුම්කරුගේ විස්තර

සම්පූර්ණ නම :-------------------------------------------------------

ලිපිනය :- :-------------------------------------------------------

තනතුර :-------------------------------------------------------

2. ගගන යාත්‍රාංගන භූමිය පිළිබඳ විස්තර

ගගන යාත්‍රාංගනයේ නම :-------------------------------------------------------

ගගන යාත්‍රාංගනයේ භූගෝලීය ඛණ්ඩාංක* :-------------------------------------------------------

(*ගගන යාත්‍රාංගනය පිහිටි ලක්ෂ්‍යයේ GPS ඛණ්ඩාංක ලබා දිය යුතු ය.)

3. ඉල්ලුම්කරු, ගගන යාත්‍රාංගනය පිහිටි ස්ථානයේ හිමිකරු ද?

ඔව් ☐ නැත ☐

නැත්නම්, පහත තොරතුරු සපයන්න.

(අ) ස්ථානයට අදාළව ඇති අයිතිවාසිකම් පිළිබඳ විස්තර; සහ

(ආ) ස්ථානයේ හිමිකරුගේ නම හා ලිපිනය සහ ගගන යාත්‍රාංගනයක් වශයෙන් එම ස්ථානය භාවිත කිරීමට ඉල්ලුම්කරු විසින් අවසර ලබා ගත් බව පෙන්වීමට හැකි ලිඛිත සාක්ෂි.

4. ගගන යාත්‍රාංගනය භාවිත කිරීමට අපේක්ෂා කරන විශාලතම වර්ගයේ ගුවන් යානාව දක්වන්න.

කේතය* -----------------

*ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO ගුවන් යානා) යොමු කේතය.

5. ගගන යාත්‍රාංගන වර්ගීකරණය

| A | | | | B | | C | | D | | E | | | | F | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| A1 | A2 | A3 | A4 | B1 | B2 | C1 | C2 | D1 | D2 | E1 | E2 | E3 | E4 | F1 | F2 | F3 |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

6. ගගන යාත්‍රාංගනයේ වගකිවයුතු කළමනාකරුගේ නම, පදවි නාමය හා සම්බන්ධ කරගත හැකි විස්තර

| |
|---|
| නම :---------------------------------------------- |
| පදවි නාමය :---------------------------------------------- |
| සම්බන්ධ කර ගත හැකි විස්තර :---------------------------------------------- |

7. ගගන යාත්‍රාංගන බලපත්‍රයේ දැක්විය යුතු තොරතුරු

| |
|---|
| ගගන යාත්‍රාංගනයේ නම :---------------------------------------------- |

| |
|---|
| ගගන යාත්‍රාංගනය මෙහෙයවීමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මම මෙයින් ඉල්ලුම් කර සිටිමි. |
| අත්සන :---------------------------------------------- |
| දිනය :---------------------------------------------- |

<u>තොරතුරු</u>

1. ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතෙහි පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.
2. ඉල්ලුම්පත්‍රයේ සඳහන් සියලු කරුණු තහවුරු කිරීම වෙනුවෙන් ලේඛනගත සාක්ෂි ඉල්ලා සිටිය හැකි ය.

ආ ආකෘතිය

[5 වන නියෝගය]

යොමුව : (ගොනු යොමු අංකය)

ගගන යාත්‍රාංගන බලපත්‍ර අංකය : (බලපත්‍ර අංකය)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය**

ජලාශ්‍රිත ගගන යාත්‍රාංගන බලපත්‍රය

(ජලාශ්‍රිත ගගන යාත්‍රාංගනයේ නම)

මෙය, 2022 අංක 1 දරන ශ්‍රී ලංකා ජලාශ්‍රිත ගගන යාත්‍රාංගන නියෝගවල 5 වන නියෝගය ප්‍රකාරව, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, (ගගන යාත්‍රාංගන මෙහෙයුම්කරුගේ නම) වෙත, මෙහි ඇමුණුමෙහි දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව (ජලාශ්‍රිත ගගන යාත්‍රාංගනයේ නම) ජලාශ්‍රිත ගගන යාත්‍රාංගනයක් පිහිටුවීම, මෙහෙයවීම සහ පවත්වාගෙන යාම සඳහා ගගන යාත්‍රාංගන බලපත්‍රය නිකුත් කරන ලද බව සහතික කිරීම පිණිස වේ.

මෙම බලපත්‍රය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අත්හිටුවනු ලැබ හෝ අවලංගු කර ඇත්නම් මිස අත්හිටුවනු ලබන හෝ අවලංගු කරනු ලබන තෙක් වලංගු වේ.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්

නො. 152/1, මිනුවන්ගොඩ පාර,
කටුනායක.

දිනය :

**II** වන උපලේඛනය [5 වන සහ 13 වන නියෝග]

## ජලාශ්‍රිත ගගන යාත්‍රාංගන බලපත්‍රයේ කොන්දේසි

1. මේ බලපත්‍රය වෙනත් කිසිවකු වෙත පැවරිය නොහැකි ය.

2. බලපත්‍ර දරන්නා විසින්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතෙහි 120 වන වගන්තිය ප්‍රකාරව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ගේ අදාළ නියමයන්ට සහ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් කලින් කලට දැනුම් දෙනු ලබන යම් නියමයකට අනුකූල විය යුතු ය.

3. බලපත්‍ර දරන්නා විසින්, අනුමත ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති කාර්ය පටිපාටිවලට අනුකූලව ගගන යාත්‍රාංගනය මෙහෙයවීම සහ පවත්වාගෙන යාම කළ යුතු ය.

4. බලපත්‍රය දරන්නා විසින් සම්පූර්ණ, නිවැරදි හා යාවත්කාලීන කරන ලද ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතක් පවත්වාගෙන යා යුතු ය.

5. ගුවන් යානය, මෙහෙයුම් කාර්ය මණ්ඩලය, මගීන් හෝ දේපළ පිළිබඳ නිරුපද්‍රිතතාව හෝ ආරක්ෂාව අවදානමෙහි හෙළනු ලබන හෝ අවදානමෙහි හෙළිය හැකි හදිසි අවස්ථාවක දී මිස, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ පූර්ව අනුමතය නොමැතිව ජලාශ්‍රිත ගගන යාත්‍රාංගනයේ බලපත්‍ර දරන්නා සහ එහි සේවා නියුක්තයන් විසින් ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතේ නිශ්චිතව දක්වා ඇති අනුමත විධිවිධානවලින් බැහැර නොවිය යුතු ය. ඉහත සඳහන් කරන ලද හේතු මත අනුමත නියමයන්ගෙන් යම් බැහැරවීමක් සිදුවුවහොත්, ඊට හේතු දක්වමින් ඒ පිළිබඳ වහාම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත දැනුම්දිය යුතු ය.

6. ජලාශ්‍රිත ගගන යාත්‍රාංගන බලපත්‍ර දරන්නා විසින්-

(අ) අවස්ථාවෝචිත පරිදි, ජලාශ්‍රයේ හෝ ජලාශ්‍රිත ගගන යාත්‍රාංගනයේ හිමිකරු සමග සම්බන්ධ වී එහි වටපිටාව ගුවන් යානා මෙහෙයුම්වල නිරුපද්‍රිතතාව සහතික වන පරිදි පවත්වාගෙන යා යුතු ය;

(ආ) ජලාශ්‍රිත ගගන යාත්‍රාංගන ධාවන ප්‍රදේශය උපද්‍රව වලින් සහ බාධකවලින් තොරව පවත්වාගෙන යා යුතු ය.

7. ජලාශ්‍රිත ගගන යාත්‍රාංගන බලපත්‍ර දරන්නා විසින් -

(අ) ගගන යාත්‍රාංගනය හරහා මෙහෙයවන සියලුම ගුවන් යානා, 108 වන ගුවන් සංතරණ නියෝගය යටතේ වන ශබ්ද හා කම්පන යටතේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට සහ අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ට අනුකූල වන බවට වගබලා ගත යුතු ය;

(ආ) දෘශ්‍ය පියාසැරි රීතීන්හි කොන්දේසිවලට යටත්ව උදය කාලයේ සිට සවස් කාලය දක්වා ගුවන් යානා ධාවන කටයුතු සිදුවන බවට වගබලාගත යුතු ය;

(ඇ) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චිතව ම ලිඛිතව අනුමත කරනු ලැබ ඇත්තේ නම් මිස, ජාත්‍යන්තර වශයෙන් මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා ගගන යාත්‍රාංගනය භාවිත කිරීමට ගුවන් යානයකට ඉඩදෙනු නොලබන බවට වගබලා ගත යුතු ය;

(ඈ) අදාළ නියෝග, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති සහ අනුමත කාර්ය පටිපාටි කඩකරමින් යම් ගුවන් යානයකට ගගන යාත්‍රාංගනයක් භාවිත කිරීමට අවසර දෙනු නොලැබිය යුතු ය;

(ඉ) සියලුම සංඥා, ප්‍රමිතිගත සංකේත භාවිත කරමින් පවත්වාගෙන යා යුතු නාම පුවරු සහ තොරතුරු පත්‍රිකා අනුමත ගගන යාත්‍රාංගන මෙහෙයුම් අත්පොතෙහි නියමයන්ට සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යා යුතු ය;

(ඊ) ජාතික සිවිල් ගුවන් සේවා ආරක්ෂක වැඩසටහනෙහි නියමයන්ට අනුකූල වන බව සහතික කරමින් ඵලදායී ගුවන්තොටුපල ආරක්ෂක වැඩසටහනක් පිහිටුවා පවත්වාගෙන යා යුතු ය;

(උ) ජලාශ්‍රිත ගගන යාත්‍රාංගනයේ සම්පූර්ණ මෙහෙයුම් කටයුතුවලට අදාළව නිරුපද්‍රිතතා කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යා යුතු ය;

(ඌ) පහත දැක්වෙන කවර හෝ අවස්ථාවක් පිළිබඳව වහාම සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය-

(i) ගගන යාත්‍රාංගනයේ හෝ එහි වටපිටාවෙ හි සිදුවන ගුවන්යානා අනතුරක් හෝ ඒ හා සම්බන්ධ සිදුවීමක්;

(ii) මගීන්ගේ නිරුපද්‍රිතතාවට හෝ ආරක්ෂාවට බලපාන්නා වූ ගගන යාත්‍රාංගනය තුළ සිදුවන යම් සිදුවීමක්;

(iii) යම් නිරුපද්‍රිතතා හෝ ආරක්ෂක නියම කඩ කිරීමක්;

(iv) ගුවන් තොටුපලේ සිටින ගුවන් යානා මෙහෙයුම් සම්බන්ධ තැනැත්තන්ගේ නිරුපද්‍රිතතාව හෝ ආරක්ෂාවට අහිතකර ලෙස බලපාන දෝෂයක් හෝ අඩුපාඩුවක් හෝ අඩුලුහුඬුකම්;

(v) තාවකාලිකව හෝ ස්ථිරව හෝ ගගන යාත්‍රාංගනය වසා දැමීම;

(vi) යම් හේතුවක් නිසා ගගන යාත්‍රාංගන මෙහෙයුම් කටයුතු නතර කිරීම.

8. වාර්ෂික බලපත්‍ර ගාස්තුව නියම කරනු ලබන පරිදි ගෙවිය යුතු ය.

EOG 08 - 0078

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.